**16-03-2025 මධුබන් අව්‍යක්ත් බාප්දාදා ඕම් ශාන්ති 2004/03/05**

**ඔබගේ දුර්වල සංස්කාර පුළුස්සා දමා සැබෑ හෝලිය සමරන්න,**

**ලෝකය පරිවර්ථනය වන්නේ එවිට පමණයි.**

අද බාප්දාදා සෑම තැනකම සිටින ඔහුගේ රාජ් දුලාරේ (ආදරණීය රජ කුමර) දරුවන්ව දකිනවා. කෝටි ගණනක් අතරින් ඔය ශ්‍රේෂ්ඨ ජීවාත්ම අතලොස්සට පමණයි පරමාත්ම දෙවියන්ගේ ආදරය සහ සෙනෙහස ලැබෙන්නේ. බාප්දාදා ඔය සෑම දරුවෙකුගේම රාජකීය සිංහාසන තුන දකිනවා. ඔය දරුවන්ට මෙම සිංහාසන තුන ලැබෙන්නේ සංගම යුගයේදී පමණයි. ඔබට සිංහාසන තුන පෙනෙනවාද? එකක්, ජීවාත්මය එය මත දිලිසෙන, නළලේ සිහසුනයි. දෙවන සිහසුන පරමාත්ම දෙවියන්ගේ හදවත් සිහසුනයි. ඔබ හදවත් සිහසුනේ අසුන්ගෙන සිටිනවා නේද? ඉන්පසුව, තුන්වන සිංහාසනය වන්නේ අනාගත ලෝකයේ සිංහාසනයයි. හදවත් සිහසුන මත අසුන්ගෙන සිටීමෙන් ඔබ වඩාත්ම භාග්‍යවන්ත අය වී ඇත. පරමාත්ම දෙවියන්ගේ මෙම හදවතේ සිහසුන ලැබී ඇත්තේ ඔය භාග්‍යවන්ත දරුවන්ට පමණයි. අනාගත ලෝක රාජධානියේ සිහසුන ඔබට අනිවාර්යෙන් ලැබෙයි, නමුත් එයට අයිතිවාසිකමක් තිබෙන්නේ කාටද? මෙකල ස්ව-පාලකයන්, තමන්ගේ පාලකයන් වන අයට. ඔබට ස්ව-ආධිපත්‍යය නොමැති නම්, ලෝක රාජධානිය හිමිකරගත නොහැක, මන්ද, ඔබට ලෝක රාජධානිය හිමි වන්නේ මෙකල ස්ව-ආධිපත්‍යය තුළින් නිසා. ලෝක රාජධානිය වෙනුවෙන් සියලුම සංස්කාර නිර්මාණය වන්නේ මේ කාලයේ. එසේ නම්, ඔය සෑම කෙනෙක්ම තමන් නිරන්තර ස්ව-අධිපතියෙක් බව අත්දකිනවාද? අනාගත රාජධානියේ වර්ණනාව ඔබ දන්නවා නේද? එය: එක් ධර්මයක්, එක් රාජධානියක්, නීතිය සහ විනය, සාමය, සතුට සහ සමෘද්ධියෙන් පිරි රාජධානියක්. ඔබට කී වතාවක් ස්ව-ආධිපත්‍යය සහ ලෝක රාජධානිය තිබුණාද කියා ඔබට මතකද? ඔබ කී වතාවක් පාලනය කර තිබේද කියා ඔබට මතකද? ඔබට එය පැහැදිලිව මතකද? එසේ නැත්නම් එය සිහි කිරීමට ඔබ උත්සාහ දැරූ විට පමණයිද, ඔබට එය මතක් වෙන්නේ? ඔබ ඊයේ දිනයේ පාලනය කළ අතර හෙට දින නැවත පාලනය කරයි. ඔබට එතරම් පැහැදිලි අවධානයක් තිබෙනවාද? මෙකල නිරන්තර ස්ව-අධිපතියන් වන අයට මෙම අවධානය පැහැදිලිව තිබෙයි. ඉතිං ඔබ ස්ව-අධිපතියන්ද? ඔබ සෑම විටම මෙයද, නැත්නම් ඇතැම් විටෙක පමණයිද? ඔබ කියන්නේ කුමක්ද? ඔබ නිරන්තර ස්ව-අධිපතියන්ද? මෙය ද්විත්ව විදේශිකයන්ගේ වාරයයි. ඔබ නිරන්තරයෙන් ස්ව-අධිපතියන්ද? පාණ්ඩවයන්, ඔබ සෑම විටම මෙයද? ඔබ සෑම විටම මෙයද කියා, බාබා විමසනවා. ඇයි? ඔබ මෙම එක උපතෙදී නිරන්තර ස්ව-අධිපතියන් නොවෙයි නම්, එමෙන්ම එය කෙටි උපතකි, එසේ නම්, උපත් 21කට ඔබ එම නිරන්තර ස්ව-ආධිපත්‍යය හිමි කරගන්නේ කෙසේද? ඔබට රාජධානියේ ආධිපත්‍යය හිමි කරගැනීමට අවශ්‍ය, උපත් 21කටද, නැත්නම් විටෙකදී පමණක්ද? ඔබට කුමක්ද අවශ්‍ය? ඔබට සෑම කලටම මෙය වීමට අවශ්‍යද? නිරතුරුව? අඩු තරමින් හිස වනන්න! අච්චා. ඔබට උපත් 21ට අධිපතියන් වීමට අවශ්‍යයි. රාජධානියට අයිතියක් ඇති කෙනෙක් වීම යනු රාජකීය පවුලේද අධිපතියෙක් වීමයි. සිහසුනේ අසුන් ගන්නේ ටික දෙනෙක් පමණයි, නමුත් එහි, රාජකීය පවුලේ අයට, සිහසුනට අයිතියක් ඇති අයගේ තරමටම ගෞරවයක් ලැබෙයි. ඔවුන්ද රාජධානියට අයිතියක් ඇති අය ලෙස හැදින්වෙයි. කෙසේවෙතත්, එම ගිණුම වත්මන් කාලය සමග සම්බන්ධයි. මෙකල, එය ඇතැම් විට පමණයි නම්, එම කාලයේද එය ඇතැම් විට පමණක් වෙයි. දැන් එය සෑම කල්හි නම්, එහිදීද එය සෑම කලටම වෙයි. එබැවින් බාප්දාදාගෙන් සම්පූර්ණ අයිතිය හිමි කරගැනීම යනු වර්ථමානයට මෙන්ම අනාගත පූර්ණ උපත් 21ටම අයිතියක් හිමි කරගැනීමයි. එසේ නම් ඔය ද්විත්ව විදේශිකයන්, සම්පූර්ණ උරුමය හිමි කරගන්න අයද, භාගයක්ද? සුළු වශයෙන්ද? ඔබ ගන්නේ කුමක්ද? ඔබට සම්පූර්ණ අයිතීන් හිමි කරගැනීමට අවශ්‍යද? සම්පූර්ණ? එක උපතක් වත් අඩුවෙන් නොවෙයි. එසේ නම් ඔබ කළ යුත්තේ කුමක්ද?

බාප්දාදා සෑම දරුවෙක්වම සම්පූර්ණ අයිතීන් ඇති අය බවට පත් කරවයි. ඔබ මෙය වෙලාද? ඔබට නිසැකද? එසේ නැත්නම් ඔබ මෙය වෙයිද, නැද්ද කියා ප්‍රශ්නයක් තිබෙනවාද? ඔබට මෙම ප්‍රශ්නය තිබෙනවාද? විටෙක ඔබට මෙම ගැටළුව තිබෙනවාද: “මා මෙය වෙයිද නැද්ද කියා මා දන්නේ නැහැ?” ඔබ මෙය විය යුතුයි. ඔබට විශ්වාසද? මෙය වීමට අවශ්‍ය අය අත් ඔසවන්න! ඔබ නියත වශයෙන්ම මෙය විය යුතුයි. අච්චා.

ඔබ සියලු දෙනාම කුමන මාලාවේ පබුළුද? 108 වේද? කී දෙනෙක් මෙහි ඇවිත් සිටිනවාද? ඔබ සියලු දෙනා 108න් කොටසක් වීමට යනවාද? කෙසේවෙතත්, මෙහි ඔබලා 1800 ක් සිටිනවා. එසේ නම් ඔබ 108 මාලාව වැඩි කරන්න යනවාද? අච්චා, නමුත් ඔබ 16,000 වීමට ප්‍රිය නොකරයි. ඔබ 16,000න් කොටසක් වෙනවාද? නැහැ නේද? ඔබට මෙම විශ්වාසය තිබෙන අතර එය නිශ්චිත වී තිබේ. ඔබට මෙම අත්දැකීම තිබිය යුතුයි. මා නොවෙයි නම් වෙන කවුරු මෙය වෙයිද? ඔබට මෙම කුල්මත් බව තිබෙනවාද? ඔබ මෙය නොවන්නේ නම්, වෙන කිසිවෙක් මෙය බවට පත් නොවෙයි, එහෙම නේද? මෙය වීමට යන අය ඔබයි. කියන්න: එම අය අපයි. පාණ්ඩවයන්, ඔබ මෙය වීමට යනවාද? අච්චා. පිටුපස අසුන්ගෙන සිටින අය, ඔබ මෙය වීමට යනවාද? ඔබ තමන් දෙස කැඩපතේ බලා තිබෙනවාද? බැලුවාද? ඔය සෑම දරුවෙකුගේම විශවාසය දැක බාප්දාදා තමාව කැප කරයි. අපූරුයි! අපූරුයි! සෑම දරුවෙක්ම අපූරුයි! ඔබ විශ්මයන් සිදු කරන අය නේද? අපූරුයි, අපූරුයි! එය ඇයි? ඇයි? නොවෙයි නේද? එය විටෙක "ඇයි?" වෙනවද? නැහැ? එය "ඇයි?" හෝ "හායි" යන දෙකෙන් එකක් වන අතර තුන්වැන්න හැඬීමයි. කෙසේවෙතත්, ඔබ අපූරුයි, අපූරුයි, අය නේද?

ද්විත්ව විදේශිකයන් වෙනුවෙන් බාප්දාදාට විශේෂ ආඩම්බරයක් තිබේ. ඇයි? භාරතයේ ජනතාව පරම පියාව භාරතය තුළට ආරාධනා කළා. කෙසේවෙතත්, ඔබ බාප්දාදාව ඔබගේ අවංකකමින්, සෙනහසේ බන්දනයෙන් බැද ඇති බැවින් පියා තුළ ද්විත්ව විදේශිකයන් කෙරෙහි විශේෂ සෙනෙහසක් තිබේ. වැඩි දෙනෙක් අවංකයි. සමහරු යම් දේවල් සගවයි, නමුත් ඔබගෙන් වැඩි දෙනෙක් අවංකව ඔබගේ දූර්වලතා පියා ඉදිරියේ තබයි. අන් සියලු දේට වඩා පියා ප්‍රිය කරන්නේ අවංකකමටයි. මේ නිසයි භක්ති මාර්ගයේ පවා ඔවුන් මෙසේ කියන්නේ : දෙවියන් සත්‍යයයි. වැඩිම සෙනෙහසක් තිබෙන්නේ අවංකකමට වන අතර අවංකකම ඇති අය, පිරිසිදුවද රැඳී සිටියි. ඔවුන් පිරිසිදුව සහ පැහැදිලිව සිටියි. මේ නිසයි, ද්විත්ව විදේශිකයන්ගේ අවංකකමට ඇති සෙනෙහසේ රැහැන, බාප්දාදාව ඇද ගන්නේ. විටෙක ඇතැම් අය සුළු වශයෙන් මිශ්‍ර වෙයි. කෙසේවෙතත්, ඔය ද්විත්ව විදේශිකයන් ඔබගේ මෙම විශේෂත්වය කිසිදා අත් නොහළ යුතුයි: අවංකකම. අවංකකමේ බලය විදුලි සෝපානයක් මෙන් ක්‍රියා කරයි. සියලු දෙනාම අවංකකමට ප්‍රිය කරයි. පාණ්ඩවයන්, ඔබ එය ප්‍රිය කරනවාද? මධුබන් වල අය පවා අවංකකමට ප්‍රිය කරයි. මධුබන් වල විවිධ ස්ථාන වලින් පැමිණි ඔබ සියලු දෙනා, අත් ඔසවන්න. ඔබ සියලු දෙනා බාහු බව, දාදි කියයි. එබැවින් මධුබන්, ශාන්තිවාන් ඔබ සියලු දෙනා අත් ඔසවන්න. ඔබගේ අත් ඉහළට ඔසවන්න. මධුබන් වල අය අවංකකමට කැමතිද? අවංකකම ඇති අයට පරම පියාව සිහි කිරීම ඉතා පහසු බව දැනෙයි. ඇයි? පියා සත්‍යය නිසා. එබැවින් අවංක අයට සත්‍ය පියාව විගසින් සිහි කිරීමට හැකි වෙයි. ඔවුන්ට උත්සාහ දැරීමට සිදුනොවෙයි. දැන් පවා, පියාව සිහි කිරීමට ඔබට වෙහෙස දැරීමට සිදුවන්නේ නම්, එවිට ඔබගේ සූක්ෂම සිතිවිලි වල හෝ ඔබගේ සිහින වල යම් තැනක අවංකකමේ අඩුවක් ඇති බව, ඔබ වටහා ගත යුතුයි. අවංකකම ඇති තැන, ඔබට "බාබා" යන සිතිවිල්ල ඇති වූ සැනින් ස්වාමී ඉදිරිපත් වෙයි. මේ නිසයි බාප්දාදා අවංකකමට බොහෝ ප්‍රිය කරන්නේ.

එබැවින් බාප්දාදා ඔය සියලුම දරුවන්ට මෙම සංඥාව ලබා දෙනවා: උපත් 21කට ඔබට ඔබගේ පූර්ණ උරුමය හිමි කර ගැනීමට අවශ්‍ය නම්, දැන් ඔබගේම රාජධානිය පරීක්ෂා කර බලන්න. දැන් ස්ව-අධිපතියෙක් වන්න, එමෙන්ම ඔබ කෙතරම් ප්‍රමාණයකට මෙය වන්නේද, එයට අනුව ඔබට අයිතියක් ලැබෙයි. එක් රාජධානියේ වර්ණනාව තිබේ. තිබෙන්නේ, දෙකක් නොව, එක් රාජධානියයි. එබැවින් ඔබගේ වත්මන් ස්ව-ආධිපත්‍ය තත්ත්වය තුළ නිරන්තරයෙන් තිබෙන්නේ එක් රාජධානිය පමණයිද? තිබෙන්නේ ස්ව-ආධිපත්‍යයද, නැත්නම් වෙනත් කෙනෙකුගේ රාජධානියත් (පාලනය) විටෙක තිබෙනවාද? විටෙක එය මායාගේ රාජධානිය නම්, එවිට ඔබ එය හඳුන්වන්නේ වෙනත් කෙනෙකුගේ රාජධානිය ලෙසද, ඔබගේ ස්ව-ආධිපත්‍යය ලෙසද? එබැවින් ඔබට නිරන්තරයෙන් එක් රාජධානිය තිබෙන බවත් ඔබ වෙනත් අය මත යැපී නොමැති බවටත් පරීක්ෂා කර බලන්න. එය විටෙක මායාගේ රාජධානිය වන අතර විටෙක ඔබගේද? ඔබ තවමත් ඔබගේ පූර්ණ උරුමය දිනා ගනිමින් සිටින බව ඔබට මෙයින් වටහා ගත හැක; ඉන් අදහස් වන්නේ ඔබට එය ලැබී නොමැති අතර එය ලැබීමට තිබෙන බවයි. එබැවින් පරීක්ෂා කරන්න: ඔබට නිරන්තරයෙන් තිබෙන්නේ එක් රාජධානියක්ද? එක් ධර්මය: ධර්මය යනු ධාරණාවයි. එබැවින් විශේෂ ධාරණාව කුමක්ද? පාරිශුද්ධත්වය පිළිබඳව. එබැවින් ඔබගේ සිතිවිලි සහ සිහින වල ඇත්තේ එක් ධර්මයද, එනම්, පවිත්‍රතාවයද? ඔබගේ සිතිවිලි හෝ සිහිනවල අපවිත්‍ර බවේ ඡායාවක් හෝ ඇත්නම්, ඔබ එයට කුමක් කියයිද? එය එක් ධර්මයද? පූර්ණ පවිත්‍රතාවය තිබේද? එබැවින් මෙය පරීක්ෂා කර බලන්න. ඇයි? කාලය දැන් වේගයෙන් ගමන් කරනවා. ඉතිං කාලය වේගයෙන් ගමන් කරන අතර ඔබ ගමන් කරන්නේ සෙමින් නම්, ඔබට වෙලාවට ඔබගේ ගමනාන්තයට ළගා වීමට නොහැකි වෙයි. එබැවින් නිරන්තරයෙන් පරීක්ෂා කරන්න: තිබෙන්නේ එක

රාජධානියද? තිබෙන්නේ එක ධර්මයද? නීතිය සහ පිළිවෙල තිබෙනවාද? නැත්නම් මායා ඇගේ නියෝග ලබා දෙනවාද? පරමාත්ම දෙවියන්ගේ දරුවන් අනුගමනය කරන්නේ, මායාගේ නීතිය සහ පිළිවෙල නොවෙයි, ශ්‍රීමත් වල නීතිය සහ පිළිවෙලයි. එබැවින් පරීක්ෂා කරන්න: අනාගතයේ සියලු සංස්කාර දැන් දිස්විය යුතුයි, මන්ද, ඔබ එම සංස්කාර වලින් පිරිය යුත්තේ දැන්ය. ඔබ එහිදි තමන්ව ඒවාගෙන් පුරවා ගන්නේ නැහැ. ඔබ තමන්ව ඒවාගෙන් පුරවා ගත යුත්තේ මෙහිදිය. ඔබට සතුට තිබෙනවාද? ඔබට සාමය තිබෙනවාද? ඔබට සමෘද්ධිය තිබෙනවාද? ඔබගේ දැන් සතුට පදනම් වී ඇත්තේ පහසුකම් මත නොවෙයි නේද? ඔබට අතීන්ද්‍රීය සතුට තිබෙනවාද? පහසුකම් ඔබගේ භෞතික ඉන්ද්‍රියයන් වෙනුවෙන් ආධාරකයි. අතීන්ද්‍රීය සුඛය පදනම් වන්නේ පහසුකම් මත නොවෙයි. ඔබට නිරන්තර නොබිඳි සාමය තිබෙනවාද? එය කිසි විටෙක බිඳී යන්නේ නැහැ නේද? ස්වර්ණමය යුගී රාජධානියේ ප්‍රශංසාව කුමක්ද? නොබිඳි සාමය. නොසැලෙන සාමය. ඔබට එම පිරිපුන් බව තිබෙනවාද? ධනය නිසා සිදු වන්නේ කුමක්ද? ඔබ පරිසමාප්ත සහ පිරිපුන් වනවා. ඔබට සෑම දේකම ධනය තිබෙනවාද? ගුණධර්ම, බල සහ දැනුම ඔබගේ ධනයයි. එහි සලකුණ කුමක්ද? ඔබ සියලු ධනයෙන් පිරිපුන් නම් එහි සලකුණ කුමක්ද? තෘප්තිය. සියලු ලැබීම් වල පදනම තෘප්තියයි. අතෘප්තිය, ලැබීම් මද බවේ සලකුණක්. එබැවින් පරීක්ෂා කරන්න: එකදු විශේෂත්වයක වත් අඩුවක් නොතිබිය යුතුයි. ඔබ වත්මන් කාලයේ සංස්කාර වල පදනමින් මුළු ලෝකයම නිර්මාණය කිරීමට යනවා. අනාගත ලෝකය නිර්මාණය කරන්නේ වත්මන් සංස්කාරයි. එසේ නම් ඔබ සියලු දෙනා පවසන්නේ කුමක්ද? ඔබ කවුද? ඔබ ලෝක පරිවර්ථකයන් නේද? ඔබ එවන් අයද? ඔබ ලෝක පරිවර්ථකයන්ද? එබැවින්, ලෝක පරිවර්ථකයන් වීමට පෙර, ඔබ ස්ව-පරිවර්ථකයන්. එබැවින් ඔබ සියලු දෙනාම තමන් තුළ මෙම සංස්කාර පරීක්ෂා කළ යුතුයි. මෙයින් ඔබ 108 මාලාව තුළ සිටිනවාද, නැත්නම් ඉදිරියේ හෝ පිටුපස යම් තැනක සිටින්නේද කියා ඔබට වටහාගත හැක. මෙම පරීක්ෂා කිරීම ඔබගේ කැඩපතයි. මෙම කැඩපතින් ඔබගේ වර්ථමානය සහ අනාගතය දකින්න. ඔබට එය පෙනෙනවාද?

ඔබ දැන් පැමිණ සිටින්නේ හෝලි සැමරීමටයි. එය හොඳයි. හෝලියේ අරුත ගැන ඔබ කතා කර තිබෙනවා නේද? ඔබ එය කර තිබෙනවා නේද? එබැවින් අද, බාප්දාදා විශේෂයෙන් ඔය ද්විත්ව විදේශිකයන්ට කතා කරන අතර මධුබන් වල අයත් ඔබ සමග සිටිනවා. මෙය ඉතා හොඳයි. බාප්දාදා මධුබන් වල අයට මෙන්ම ඔබටත් කතා කරනවා. පැමිණ සිටින ඔබ සියලු දෙනා, ඔබ බොම්බායෙන්, දිල්ලියෙන් හෝ වෙන කොහේ සිට පැමිණියත්, මෙකල ඔබ සියලු දෙනාම මධුබන් වැසියන්. මෙකල, ද්විත්ව විදේශිකයන් කොහේ වැසියන්ද? ඔබ මධුබන් වැසියන් නේද? මධුබන් වැසියෙක් වීම හොඳයි නේද? එබැවින් සියලුම දරුවන්ට, ඔබ මෙහි බාප්දාදා ඉදිරිපිට අසුන්ගෙන සිටියත්, ඔබ තමන්ගේම ස්ථානයේ අසුන්ගෙන සිටියත්, වෙන කොහේ සිටියත්, බාප්දාදාට අවශ්‍ය වන්නේ, එක් පරිවර්ථනයක් තිබිය යුතු බවයි. ඔබට එඩිතරකම ඇත්නම්, බාප්දාදා ඔබට ඒ ගැන පවසන්නම්. ඔබට එඩිතරකම තිබෙනවාද? ඔබට මෙම එඩිතරකම තිබෙනවාද? ඔබ එඩිතරද? ඔබට එය කිරීමට සිදුවෙයි. ඔබ එය කළ යුතු වනවා, එබැවින් නිකම්ම ඔබගේ අත ඔසවා එය සිදුවී ඇති බව නොසිතන්න - ඒ අන්දමින් නොවෙයි. ඔබගේ අත එසවීම ඉතා හොඳයි, නමුත් ඔබගේ මනසේ අත ඔසවන්න. අද එම අත නිකම්ම ඔසවන්න එපා, නමුත් ඔබගේ මනසේ අත ඔසවන්න.

ඔය ද්විත්ව විදේශිකයන් සමීපව අසුන්ගෙන සිටිනවා, එබැවින් හදවතේ ඇති දේවල් කියන්නේ සමීප අයටයි. බාප්දාදා සහ සේවය වෙනුවෙන් ඔබගෙන් වැඩි දෙනෙක් තුළ ඉතා හොඳ සෙනෙහසක් තිබෙන බව දැක තිබෙනවා. ඔබට පියාගේ සෙනෙහස නොමැතිව සිටිය නොහැකි අතර සේවය නොකරත් සිටිය නොහැක. ඔබ වැඩි දෙනෙකුගේ මෙම සහතිකය හොඳයි. බාප්දාදා සෑම තැනක්ම දකිනවා, නමුත්... "නමුත්" තිබෙනවා. වැඩි දෙනෙකුගෙන් මතුවන හඬ වන්නේ: " මගේ ස්ව කැමැත්තට විරුද්ධව තවමත් මාව ඇදගන්නා එක හෝ තව පැරණි සංස්කාරයක් තිබෙනවා." ඉතිං ඔබ දැන් පැමිණ සිටින්නේ හෝලි සැමරීමටයි, එමෙන්ම හෝලි යනු: අතීතය අතීතයේම තැබීමයි. එය සිදුවී ඇත, එය දැන් අවසන්. එබැවින් ඔබට සුළුවෙන් හෝ යම් සංස්කාරයක් ඇත්නම්, 5%, 10% හෝ 50% වුනත් කම් නැත, එය කොපමණ වුනත්, එය 5% වුනත්, එම සංස්කාර වල හෝලිය පුළුස්සා දමන්න. මෙම සංස්කාරය විටින් විට ඔබට සහ අන් සියලු දෙනාට බාධා කරන බව සිතන අය: මෙය කුමක්ද කියා ඔබට වැටහෙනවා නේද? ඔබට එය වැටහෙනවාද? එසේ නම්, එක හෝලියක් තිබෙන්නේ පිළිස්සීමට වන අතර අනෙක් හෝලිය වර්ණ ගැන්වීමටයි. හෝලි වර්ග දෙකක් තිබේ. හෝලි හී අරුත වන්නේ: අතීතය, අතීතයයි. එබැවින් එය නිසා ලෝකයේ පරිවර්ථනය සිදු නොවන යම් සංස්කාරයක්, ඔබට තවමත් ඇත්නම්, බාප්දාදාට අවශ්‍ය වන්නේ - එම දුර්වල සංස්කාරය අද පුළුස්සා දමන්න, එනම්, එම දුර්වල සංස්කාරය ආදාහනය කරන්න. පුළුස්සා දැමීම, ආදාහනය කිරීම ලෙසත් හඳුන්වනවා නේද?

පුද්ගලයෙක් මිය ගිය විට ආදාහනය පවත්වන බව ඔවුන් කියයි, එනම්, එය සෑම කලටම අවසන් කළ යුතුයි. එබැවින් අද එම සංස්කාර වල ආදාහනය ඔබට සිදුකළ හැකිද? ඔබට එය කළ හැකිද? ඔබ මෙසේ කියයි: "එම සංස්කාර පැමිණෙනවාට මා කැමති නැහැ, නමුත් ඒවා එනවා, ඒ නිසා මං මොනවා කරන්නද?" ඔබ සිතන්නේ මේ අන්දමටද? අච්චා. " එය එන්නේ වැරදීමකින්." ඔබ යම් කෙනෙකුට දුන් දෙයක් වැරදීමකින් නැවත ඔබ වෙතට එන්නේ නම්, ඔබ කරන්නේ මොනවාද? ඔබ එය ප්‍රවේසමින් අල්මාරියක් තුළට දමනවාද? එබැවින් එය නැවත පැමිණියත් එය ඔබගේ හදවත තුළ තබා නොගන්න, මන්ද, ඔබගේ හදවත තුළ පරම පියා අසුන්ගෙන සිටිනවා නේද? එම සංස්කාර පියා සමග එකට තබන්න ඔබ කැමතිද? ඔබ එයට කැමති නැහැ නේද? එබැවින් එය වැරදීමකින් හෝ ආපසු එන්නේ නම්, ඔබගේ හදවතින් මෙසේ කියන්න, "බාබා, බාබා". එපමණයි! එය අවසන් කරන්න! නැවතීමේ තිතක් තැබෙයි. බාබා කුමක්ද? තිතයි. එබැවින් නැවතීමේ තිතක් තැබෙන්නේ ඔබ හදවතින් එය පැවසුවොත් පමණයි. ඔබගේම ආත්මාර්ථකාමීත්වයෙන් ඔබ නිකම්ම බාබාව සිහි කර මෙසේ කියන්නේ නම්, "බාබා එය ගන්න. එය ඉවත් කරන්න", එවිට ඔබ කරන්නේ එය ඔබ සමග තබා ගැනීමයි. ඔබ බාබාට එය ඉවත් කිරීමට කියන නමුත්, ඔහු එය ඉවත් කරන්නේ කෙසේද? එසේ නම් ඔබ කරන්නේ කුමක්ද? ඔබ හෝලි සමරනවාද? ඔබ එය සමරනවාද? හෝලි - හෝ ලි (එය සිදුවිය). අච්චා. මෙම අධිෂ්ඨානගත සිතිවිල්ල ඔවුන්ට තිබෙයි කියා සිතන අය - හොඳයි, ඔබ නැවත නැවතත් එය ඉවත් කරගැනීමට තැත් කරයි නේද? එවිට එය ඉවත්ව යයි. එය ඔබ තුළ තබා නොගන්න: "මං මොනවා කරන්නද? මා මෙය කරන්නේ කොහොමද? මට එය ඉවත් කළ නොහැක." මෙසේ නොකියන්න. ඔබ එය ඉවත් කළ යුතුයි. එසේ නම්, ඔබ මෙම අධිෂ්ඨානගත සිතිවිල්ල ඇති කරනවාද? මෙය කරන අය අත් ඔසවන්න! බාහිරින් පමණක් නොවෙයි, ඔබගේ මනසේ අත ඔසවන්න. ඔබගේ මනසේ අත ඔසවන්න. (සමහරු ඔවුන්ගේ අත් එසවූයේ නැහැ.) මේ මිනිසුන් අත් ඔසවන්නේ නැහැ. ඉතා හොඳයි. සුබ පැතුම්. සුබ පැතුම්. මන්ද, එක් පැත්තකින් පෙර ගමන් ගිය අය (advance party) නැවත නැවතත් බාප්දාදාගෙන් විමසනවා: "තව කොපමණ කාලයක්ද? තව කෙතරම් කාලයක්ද? තව කොපමණ කල්ද?" දෙවනුව, පදාර්ථ බාප්දාදාට පවසන්නේ: "දැන් පරිවර්ථනය ගෙන එන්න." බ්‍රහ්ම පියා පවා පවසන්නේ: "පරම දනව්වට දොරටු විවර වන්නේ කවදාද?" ඔබට ඔහුත් සමග යාමට අවශ්‍යයි නේද? ඔබව දමා යනවාට ඔබ කැමති නැහැ නේද? ඔබ යන්නේ ඔහු සමගයි, එහෙම නේද? එසේ නම් දැන් මෙම පරිවර්ථනය ගෙන එන්න. එපමණයි. ඔබ මෙම පරිවර්ථනය සිදු කළ යුතුයි. එය ඔබට අයත් දෙයක් නොවෙයි. වෙන කෙනෙකුට අයත් දෙයක්, රාවනට අයිති දෙයක්, ඔබ තබාගෙන සිටින්නේ ඇයි? වෙන කෙනෙකුට අයිති දෙයක් ඔබ තබාගෙන සිටිය යුතුද? එසේ නම්, මෙය අයිති කාටද? එය අයිති වන්නේ රාවනට නේද? ඔහුට අයිති දෙයක් ඔබ ළග තබා සිටින්නේ ඇයි? ඔබ එය තබාගෙන සිටිය යුතුද? ඔබ එය තබා ගන්නේ නැහැ නේද? ඔබට නිසැකද? නිසැකද? අච්චා. ඔබට පාට සමග හෝලිය සැමරිය හැක, නමුත් පළමුව මෙම හෝලිය සමරන්න. ඔබගේ ප්‍රශංසාව වන්නේ මෙය බව ඔබට දැකගත හැක: දයාවෙන් පිරි. ඔබ එහෙමද? දයාවෙන් පිරි දෙවි දේවතාවන් ඔබලා නේද? ඔබ එසේද? එසේ නම් ඔබට අනුකම්පාවක් දැනෙන්නේ නැද්ද? ඔබගේ සහෝදර සහෝදරියන් සිටින්නේ බොහෝ දුකින්; ඔවුන්ගේ දුක දැක, ඔබට අනුකම්පාවක් දැනෙන්නේ නැද්ද? ඔබට අනුකම්පාවක් දැනෙනවාද? එසේ නම් ඔබගේ සංස්කාර වෙනස් කරන්න, එවිට ලෝකය වෙනස් වෙයි. ඔබගේ සංස්කාර වෙනස් කරන තුරු, ලෝකය වෙනස් කළ නොහැක. එසේ නම් ඔබ කරන්නේ කුමක්ද?

අද සියලු දෙනාටම ද්‍රිෂ්ටී ගැනීමට අවශ්‍ය බවට සුබ පුවත බාප්දාදාට ඇසුණා. එය හොඳයි. බාප්දාදා දරුවන්ට කීකරුයි, නමුත්... "නමුත්" ඇසීමෙන් ඔබ සිනහ වෙනවා. ඔබට සිනහසෙන්න පුළුවන්... මෙවන් කියමනක් තිබේ: "ලෝකය වෙනස් වන්නේ කෙනෙකුගේ දැක්ම තුළින්." එබැවින් ඔබට අද ලැබෙන ද්‍රිෂ්ටීයෙන් ඔබ ලෝකය පරිවර්ථනය කළ යුතුයි. අංග සම්පූර්ණ විමට සහ සියලු ලැබීම් හිමි කරගැනීමට දිගු කාලයක් පුරා මෙම පුහුණුව අවශ්‍ය බව, බාප්දාදා දකිනවා. එය ඒ වෙලාවට සිදුවෙයි කියා, නොසිතන්න; නැහැ. ඔබට දීර්ඝ කාලයකට රාජධානියේ භාග්‍යය හිමි කරගැනීමට අවශ්‍යයි, එබැවින් අංගසම්පූර්ණත්වයත් දිගු කලක් පුරා තිබීමට අවශ්‍යයි. මෙය හොඳද? ඔය ද්විත්ව විදේශිකයන් සතුටින්ද? අච්චා.

සිංහාසන තුනම මත අසුන්ගෙන සිටින සියලුම විශේෂ ජීවාත්මයන්ට, ස්ව-අධිපතියන් වන විශේෂ ජීවාත්මයන්ට, දයාවන්ත වී සියලු ජීවාත්මයන්ට සතුට සහ සාමයේ බිඳක් ලබා දෙන ශ්‍රේෂ්ඨ දානපති ජීවාත්මයන්ට, පියාට සමාන සහ නිරතුරුවම අධිෂ්ඨානය සහ සාර්ථකත්වය අත්දකින ජීවාත්මයන්ට, බාප්දාදාගේ සෙනෙහස, ස්මරණය සහ නමස්කාරය.

**වරදානය:** ඔබ අභ්‍යන්තර පරීක්ෂකයෙක් වී, සිතිවිලි සහ වචන වල විස්තාරණය, එහි සාරයට දමත්වා. නිෂ්ඵල සිතිවිලි වල විස්තාරණය නවතා, සාරයේ ස්ථිතිය තුළ ස්ථාවර වන්න, එනම්, නිෂ්ඵල වචන වල හඬ මුසුකර, එය බලවත් කරගන්න, එනම්, එහි සාරයට එය දමන්න. අභ්‍යන්තර පරීක්ෂාව මෙයයි. ඔවුන්ගේ නිහැඬියාවේ බලයෙන්, එවන් අභ්‍යන්තර පරීක්ෂක දරුවන්ට, සැරිසරන ජීවාත්මයන්ට ඔවුන්ගේ නිවැරදි ගමනාන්තය පෙන්විය හැක. මෙම නිහැඬියාවේ බලයට බොහෝ සුන්දර, ආධ්‍යාත්මික, වර්ණවත් ක්‍රීඩා පෙන්විය හැක. නිහැඬියාවේ බලයෙන් ඔබට සෑම ජීවාත්මයකගේම මනසේ හඬ කෙතරම් සමීපව ඇසිය හැකිද යත්, එය ඔවුන් ඔබ ඉදිරියේ පෞද්ගලිකව කතා කරනවා මෙනි.

**පාඨය:** ඔබගේ ස්වභාවයෙන්, සංස්කාර වලින් සහ නෑ සබඳතා වලදී, සැහැල්ලුවෙන් සිටීම යනු, සුරදූතයෙක් වීමයි.

***** ඕම ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: සත්‍යයේ සහ යහපත් ආචාරශීලී බවේ සංස්කෘතියක් හදාගන්න.**

අවංක හදවත් ඇති අවංක දරුවන්ට, ඔවුන්ගේ අවංකත්වයේ ශ්‍රේෂ්ඨත්වය නිසා, තත්පරයක් තුළ තිතක් වී, තිතක් වන පරම පියාව සිහි කළ හැක. අවංක හදවත් ඇති අය, ස්වාමීව සතුටු කරයි, එමෙන්ම පියාගෙන් විශේෂ ආශිර්වාද ලැබීම නිසා, ඔවුන්ට ඔවුන්ගේ හිස, යුක්තියුක්තව (නිවැරදි ක්‍රමවේද භාවිතා කරමින්) තබාගෙන, කාලයට අනුව ඕනෑම කාර්යයක් නිවැරදිව කළ හැක. මෙයට හේතු වන්නේ ඔවුන් නුවණැති බුද්ධිය වන පියාව සතුටු කර ඇති නිසයි. පරමාත්ම පියාව සතුටට පත් කර ඇති අය, ඉබේටම රාස්යුක්ත (සියලු රහස් දන්නා) සහ යුක්තියුක්ත වෙයි.

**දැන්වීම:** අද, තුන්වන ඉරුදින, ලෝක භාවනා පැය වන අතර ප:ව 6.30 සිට 7.30 දක්වා සියලුම සහෝදර සහෝදරියන් සාමූහිකව යෝග තපස්යාවේ අසුන්ගෙන, සියලු ජීවාත්ම කෙරෙහි මෙම පිවිතුරු හැඟීම් ඇති කරයි: සියලු ජීවාත්මයන්ට යහපතක් සිදුවේවා, සියලු ජීවාත්ම, සත්‍යයේ මාවතේ ඇවිද ගොස්, ඔවුන්ගේ උරුමයට අයිතියක් හිමිකර ගනිත්වා. මා, පරම පියා හා සමානව සියලු ජීවාත්මයන්ට, මුක්තිය සහ ජීවන-මුක්තියේ ආශිර්වාදය ලබා දෙන ජීවාත්මයක් වෙමි.